

# තොරතුරු අයිතියට වසර තුනයි

2020 පෙබරවාරි මස 03 වෙනිදාට තොරතුරු ලබාගැනීමේ අයිතිය පුරවැසියාට ලැබී වසර තුනක් සම්පූර්ණ විය. තොරතුරු දැනගැනීමේ පනත හරහා ජනතාවට අවශ්‍ය කරන තොරතුරු ලබාදීමට සියලු රාජ්‍ය ආයතන බැඳී සිටින අතර ඒ වෙනුවෙන් සෑම රාජ්‍යය ආයතනයකටම තොරතුරු නිලධාරියෙක් හෝ නිලධාරිනියක් ද පත්කර ඇත. තොරතුරු අයිතිය වඩාත් ශක්තිමත් කිරීමට නම් පුරවැසියන්ට මෙන්ම රාජ්‍ය නිලධාරීන්ට ද සුවිශේෂී කාර්යභාරයක් ඉටු කිරීමට ඇත. පුරවැසියන් ලෙස අප හැකි පමණින් තොරතුරු අයිතිය භාවිතා කල යුතු අතර අනෙක් අතින් රාජ්‍ය නිලධාරීන් තොරතුරු අයිතියට ප්‍රමුඛස්ථානය දෙමින් පනතෙන් දක්වා ඇති කාලසීමාවන්ගෙන් බැහැර නොවී තොරතුරු අයදුම්පත්‍ර වලට ප්‍රතිපාදන සැලසිය යුතුයි.

තොරතුරු දැනගැනීමේ අයිතිය පුරවැසියා සහ රාජ්‍යය අතර ශක්තිමත් සම්බන්ධතාවයක් ගොඩ නගන පාලමක් වුවද තවමත් එම අයිතිය භාවිතයට ගන්නෙ සීමිත පිරිසකි. විශේෂයෙන්ම මධ්‍යවේදීන්, සිවිල් සංවිධාන සහ වැඩිහිටි ප්‍රජාව මෙම අයිතිය බහුලව භාවිතා කර තම ගැටළුවලට විසඳුම් ලබාගන්නා බව දක්නට ලැබේ. කෙසේ නමුත් තොරතුරු දැනගැනීමේ අයිතිය ප්‍රයෝජනයට ගන්නා තරුණ ප්‍රජාවගේ අඩුවක් දක්නට ලැබෙයි. තරුණ ප්‍රජාව තොරතුරුවලින් සන්නද්ධ කිරීම රටක් භෞතික වශයෙන් හා මානව සම්පත වශයෙන් දියුණු කිරීමට මහඟු පිටුවහලක් වනු ඇත. තොරතුරු දැනගැනීමේ අයිතිය භාවිතා කර සාර්ථක ප්‍රතිඵල ලැබූ සියලු දෙනා මේ පිළිබිඳව තරුණ ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කරනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු. තරුණ ප්‍රජාව මෙන්ම මෙරට අනාගතය භාරගැනීමට සිටින පාසල් දරුවන් අතර ද තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳව කතිකාවක් ඇති කිරීම ඉතා වැදගත් ය.

තම අයිතීන් සුරක්ෂිත කරගැනීම උදෙසා ජනතාවට ලැබී ඇති ප්‍රහලම අවිය තොරතුරු දැනගැනීමේ අයිතිය බව අපි විශ්වාස කරන්නෙමු. තොරතුරු දැනගැනීමේ අයිතිය ප්‍රජාවට ලැබුන දින පටන් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ කටයුතුවල නිරතවූ අප ආයතනය පුරවැසියාගේ විශ්‍රාම වැටුප සම්බන්ධ කටයුතුවල සිට අධ්‍යාපන, සෞඛ්‍ය වැනි පොදු ගැටලු වලට පවා විසඳුම් ලබාගැනීමට ප්‍රජාව සමග එක්ව සුහදව කටයුතු කර ඇති බව සතුටින් දන්වා සිටිමු.

මෙය කියවන ඔබ, තව එක් අයකු හෝ මෙම අයිතිය ගැන දැනුවත් කරන්නේ නම් එය රටේ අනාගතය වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටුකරනු ඇත. ඒවගේම ඔබගේ ප්‍රදේශයේ ජනතාව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ දැනුම්වත් කිරීමට අවශ්‍යනම් ඒ පිළිබඳව ඔබත් සමග එක්ව කටයුතු කිරීමට අප සූදානම් බවද දන්වා සිටිමු.

## තොරතුරු දැනුම

පහත ප්‍රශ්න වලට පිලිතුරු අප වෙත එවන්න

**ප්‍රශ්න අංක 01.**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිලිබඳ පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද්දේ කුමන වර්ෂයේද?

A. 2014 B. 2015 C. 2016 D. 2017

**ප්‍රශ්න අංක 02.**

තොරතුරු දැනගැනීමේ අයදුම්පත්‍රයක් යොමු කිරීමෙන් පසුව ඊට අදාල තීරණය ඔබ වෙත දන්වා සිටිය යුත්තේ කොපමණ කාලසීමාවක් තුලද?

A. වැඩකරන දවස් 14ක් ඇතුලත B. වැඩකරන දවස් 14කට පසුව

C. සාමාන්‍ය දවස් 14ක් ඇතුලත D. සාමාන්‍ය දවස් 14කට පසුව

**මෙම ප්‍රශ්න සඳහා ඔබගේ පිලිතුරු අපගේ 077 432 3285 දුරකථන අංකයට**
<**ඔබගේ නම**> space <**ලිපිනය**> space <**පිලිතුර 01**> space <**පිලිතුර 02**> **සමග කෙටි පණිවිඩයක් ලෙස යොමු කරන්න.**

**ඔබට මෙම පුවත් හසුන අවශ්‍ය නොවේනම් කරුණාකර පහත ලිපිනයට හරවා එවන්න**

**ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා**
**නො.5/1, එලිබෑන්ක් පාර,**
**කොළඹ 05.**

**දුරකථන:** (94) 11 4369781, 4369782, 4369783
**ෆැක්ස් :** (94) 11 2 501707
**ඊමේල් :** tisl@tisrilanka.org

වෙත -

පළමු වෙළුම - පළමු ප්‍රකාශය

# හඬ

"හඬක් නැති ප්‍රජාවට හඬක් වෙමු"

2020 පෙබරවාරි

# හඬක් නැති මිනිසුන්ට හඬක් වෙන "හඬ"



ජනරජයක් තුළ රජයේ හිමිකාරීත්වය ජනතාව සතු ය. රජය සහ රාජ්‍ය ආයතන නඩත්තු කරනු ලබන්නේ ජනතාවගේ බදු මුදලින් වන බැවින් ඒ අරමුදල් පිලිබඳව සවිස්තරාත්මක විස්තර ලබාගැනීමට ජනතාවට පූර්ණ අයිතියක් ඇත. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක තිබිය යුතු මූලික ලක්ෂණයක් වන තොරතුරු දැනගැනීමේ අයිතිය, පුරවැසියා හට ලබා දෙමින් 2016 අංක 12 දරන පනත යටතේ තොරතුරු දැනගැනීමේ අයිතිය පාර්ලිමේන්තුවේ සම්මත වීමෙන් පසුව 2017 පෙබරවාරි මස 03 වන දින සිට එම අයිතිය බලාත්මක කරනු ලැබීය. ඒ අනුව ඒතාක් මෙරට පුරවැසියාගෙන් ඈත්ව තිබූ රාජ්‍ය තොරතුරු විශාල ප්‍රමාණයක් පුරවැසියාට නිරාවරණය විය. විශේෂයෙන්ම රජය විසින් සිදු කරනු ලබන ගනුදෙනු, ජනතා මුදල් භාවිතයන්, ඇති කරගන්නා ගිවිසුම්, ආදියෙහි තොරතුරු වෙත රිසිසේ ප්‍රවේශ වීමට පුරවැසියන් හට නීතිමය පදනමක් එම පනතින් තහවුරු විය. තවද රජයේ පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම්කාරක සභාව (කෝප් කමිටුව) මාධ්‍යයට නිරාවරණය වීම ද තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ පුරවැසියා ලබාගත් සුවිසල් ජයග්‍රහණයක් ලෙස දැක්විය හැක.

**තොරතුරු දැනගැනීමේ පනත හුදෙක් පුද්ගලික අවශ්‍යතා සඳහාවන තොරතුරු දැනගැනීමට එහා ගිය සමාජ වටිනාකමකින් යුත් ක්‍රියාවලියකට දායක විය හැකි මෙවලමකි.**

තොරතුරු දැනගැනීමේ පනත හුදෙක් පුද්ගලික අවශ්‍යතා සඳහා වන තොරතුරු දැනගැනීමට එහා ගිය සමාජ වටිනාකමකින් යුත් ක්‍රියාවලියකට දායක විය හැකි මෙවලමකි. රත්මලාන ප්‍රදේශයේ වාසය කරන නලින්ද අමරවීර* මහතා ගනු ලැබූ පියවර මේ බවට කදිම උදාහරණයක් ලෙස දැක්විය හැක. වසරකට අධික කාලයක් තිස්සේ තම ප්‍රදේශයේ පවුල් 150කට අධික පිරිසකගේ එදිනෙදා ජීවිතයට බාධා කරමින් අතරමග නවතා දමා තිබූ අපවහන නල පද්ධතියක් එළීම ගැන ඔහු තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ඉල්ලුම් කරන ලදී. ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය වෙතින් ලද තොරතුරු අනුව අදාල කොන්ත්‍රාත්කරු තම ගිවිසුම උල්ලංඝණය කරමින් කටයුතු කර ඇති බව ඔහුට දැනගන්නට ලැබිණි. පසුව අමරවීර මහතා ඒ පිළිබඳ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පැමිණිළි කර අදාල බලධාරීන් විසින් කොන්ත්‍රාත්කරුට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට යොමු කිරීම ඔහු මෙන්ම අප සැවොම අත්විඳි ජයග්‍රහණයකි.

පුරවැසියන් ලෙස අප ලබාගත් විශාල ජයග්‍රහණයක් ලෙස තොරතුරු අයිතිය දක්වන්නට හැකි සේම එහි ජීවය පවතින්නේ මෙම අයිතිය නිසි ලෙස භාවිතා කිරීම තුළ බව ආවර්ජනය කළ යුතුය. කුඩා තොරතුරු අයදුම්පතකින් පුද්ගලික ප්‍රශ්නයකට පිළිතුරු සොයා ගත හැකි සේම, රටෙහි ඉහළම මට්ටමේ දූෂණ වංචා පවා හෙළිකරගනු හැක. මිනිසුන්ට ලැබුණු මේ "හඬ" පුරවැසියන් වන ඔබ ලඟට සමීපකරන්නට "හඬ" පුවත් හසුන සෑම දෙමසකට වරක්ම ඔබේ නිවහනට ලඟා වනු ඇත.

* පුද්ගල අනන්‍යතාවයන් සුරකිනු වස් නම් ගම් වෙනස් කර ඇත.



# තොරතුරු අයිතිය ගමට

නමුත් ඇතැම් අවස්ථාවල අවශ්‍යතාවය සහිත පුද්ගලයන්ට තම අවස්ථාව මගහැරී යාමේ දී ඒ පිළිබඳව විමසා තොරතුරු දැනගැනීමට හැකියාවක් තොරතුරු දැනගැනීමේ පනත යටතේ ලැබී ඇත. යාපනය, පේදුරුතුඩුව මදගෙන ප්‍රදේශයේ ජීවත් වූ මේරි ලක්මිණි* එසේ තොරතුරු ලබාගෙන තම අවශ්‍යතාවය සපුරාගත් එක් කාන්තාවකි.

ඇය දරුවන් පස් දෙනෙකුගේ මවකි. තම දරුවන් පාසල් යන වයසේ සිටියත් ඔවුන්ගේම කියා නිවසක් නොතිබුණි. නිවසක් ලබා ගැනීමේ අරමුණින් ඇය පේදුරු තුඩුව නිවාස සංවර්ධන අධිකාරියෙන් වසර 10ක සිට ඉල්ලීම් කලත් ඇයට නිවසක් නොලැබුණි. ඇයට නිවසක අවශ්‍යතාවය තිබුනත් නිවසක් නොලැබීමේ හේතුවක් දැනගැනීමට හැකියාවක් ඇය සතු නොවීය. කෙසේ නමුත් ඇය තොරතුරු දැනගැනීමේ පනත සම්මත වීමෙන් අනතුරුව 2018 වසරේදී තමා නිවසක් ලැබීමට නුසුදුස්සෙකු වූයේ ඇයි යන්න දැනගැනීම සඳහා තොරතුරු දැනගැනීමේ පනත යටතේ අයදුම්කිරීමට යොමු විය. එහි ප්‍රතිඵලයක් ලෙස දස වසරකට පසු ඇයගේම නිවසක් ලබාගැනීමේ ඇයට හැකි විය.

අම්පාර දිස්ත්‍රික්කයේ ගෝනගල-කොත්මලේ යනු යුද්ධයෙන් පීඩාවට පත් වූ පුරවැසියන් නැවත පදිංචි කරන ලද ගම්මාන වලින් එකකි. මෙම ගම්මානය උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වේ. මෙහි ජනතාවට සනීපාරක්ෂිත පානීය ජලය ඇතුළු බොහෝ මූලික අවශ්‍යතා සඳහා ප්‍රවේශය නොතිබුණි.

ගම්වාසීන් තොරතුරු දැනගැනීමේ අයදුම්පතක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත යොමුකර පානීය ජලය ලබා ගැනීම පිළිබඳව විමසා තිබූ නමුත්, ජලසම්පාදන මණ්ඩලයෙන් ලැබූ ප්‍රතිචාරයේ සඳහන් වූයේ ලැබී තිබූ සම්පාදන වලට ජල සැපයුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර අවසන් බව ය. එහෙත් පීඩාවට පත් ගම්වාසින් මින් සෑහීමකට පත් නොවූයේ තම අවශ්‍යතාවය වූ පානීය ජල සැපයුම් ගැටලුව ඉන් නොවිසදුනු නිසාය.

නමුත් පනත යටතේ තොරතුරු ඉල්ලුම් කිරීම හේතුවෙන් ගම්වාසීන් හට ඉන් අනතුරුව නිසි බලධාරීන් හමු වී තම ගැටළුව පිළිබඳ දීර්ඝව සාකච්ඡා කිරීමට අවස්ථාවක් උදා වුණි. ඒ අනුව, කොත්මලේ ප්‍රදේශය ජනතාව ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරීන් සමඟ තම පානීය ජල ප්‍රශ්නය පිළිබඳ සාකච්ඡා කරන ලදී. ඉන් මසකට පසුව ගම්වැසියන්ට පානීය ජලය ලබාදීම සඳහා මුදල් වෙන් කරන ලද ජල සම්පාදන මණ්ඩලය මීටර් 200 ක ජල නල යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී.

දරු පවුලකට හිසට සෙවණක් යනු මූලික අවශ්‍යතාවයකි. මෙම අවශ්‍යතාවය සපුරාලන්නට රජය විටින් විට යම් යම් ක්‍රියාමාර්ග ගැනීම අපි දැක ඇත්තෙමු.

තම එදිනෙදා දිවිය තුළ තොරතුරු අයිතිය පිළිබඳ පනත ප්‍රයෝජනයට ගත හැකි ආකාර සම්බන්ධව බොහෝ පුරවැසියෝ නොදැනුවත්කමින් පසුවෙති. මෙම තත්වය තුළ පුරවැසියන් අතර පනතට අදාළ ක්‍රමවේදය හා එය යොදා ගත හැකි විවිධ භාවිතයන් ගැන දැනුම ඉහල දැමීම සඳහා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය වන අප විවිධ ප්‍රචාරණ කටයුතු වල නිරත වෙමින් සිටී. ඉහත දැක්වූ උදාහරණ ද එම ප්‍රයත්නයන් හි ප්‍රතිඵල යැයි හැඳින්විය හැක. විශේෂයෙන් ඒවා අප ආයතනය විසින් විවිධ ග්‍රාමීය ප්‍රජා තුළ පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන් වලදී මතු වූ ගැටළු වන අතර, ඊට ලබාගත් පිළියම් සදහා අප විසින් එම හමුවීම් වල දී යෝජනා කළ තොරතුරු ඉල්ලුම්පත් හේතු වූ බව අපගේ බලවත් විශ්වාසයයි.

ඇත්තෙන්ම ඉහත කී කොත්මලේ උහන ප්‍රදේශයට අදාළ උදාහරණයේ දී ගම්වාසීන් හා ජල සම්පාදන මණ්ඩලයේ නිලධාරීන් මුණගැස්වීමට මැදිහත් වීමට අපට අවස්ථාවක් ලැබීම පිළිබඳ අපි ඉමහත් සතුටට පත් වුණෙමු.

ඒ අනුව, ඔබේ ගමේ හෝ ප්‍රජාව තුළ උද්ගත වී ඇති යම් ගැටළුවක් සම්බන්ධයෙන් හෝ සිදු වී ඇති දූෂිත හෝ වංචනික ක්‍රියාවක් පිළිබඳ තොරතුරු අයිතිය හරහා මැදිහත් වීමක් කළ හැකි ද නොහැකි ද යන්න ගැන ඔබ කුතුහලයෙන් පසු වේ නම්, මෙම පුවත් පත්‍රිකාවෙහි දක්වා ඇති ලිපිනය හෝ අංකය හරහා අප හා සම්බන්ධ වන්න.

* පුද්ගල අනන්‍යතාවයන් සුරකිනු වස් නම් ගම් වෙනස් කර ඇත.






# ජනතාවට සමීප වූ "RTI Van" වැඩසටහන

අම්පාර නින්තවූර් ප්‍රදේශයට අයත් මුහුදු තීරය පිරිසිදු නොකිරීම හේතුකරගෙන සවස් කාලයේ තම දූ පුතුන් සමග එහි පැමිණෙන දෙමාපියන්ට මෙන්ම වෙරළ තීරයේ සුන්දරත්වය විඳින්නට එන සියගණනක් පිරිසට දිගු කාලයක් තිස්සේ මහත් ගැටලුවලට මුහුණපාන්නට සිදුවී තිබිණි. ගම් නියම්ගම් හරහා සැරිසරමින් අප ක්‍රියාත්මක කරන RTI Van වැඩසටහන තොරතුරු දැනගැනීමේ අයිතිය ගැන ජනතාව දැනුම්වත් කිරීම සහ තොරතුවලින් ජනතාව ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව ක්‍රියාත්මක වන අතර එය අම්පාර නින්තවූර් ප්‍රදේශයටත් 2019 වසරේ සේන්දු විය. එහිදී ඉහත ගැටලුව පිලිබඳව ප්‍රදේශවාසීන් සමඟ සාකච්ඡා කොට නින්තවූර් ප්‍රාදේශීය සභාවෙන් අදාල තොරතුරු දැනගැනීමට අවශ්‍යය කරන අයදුම්පත්‍රය පුරවා යොමු කරන ලදී. ඉන් පසුව දින කිහිපයක් ඇතුලත අදාල ප්‍රාදේශීය සභාව විසින් එම වෙරළ තීරය පිරිසිදු කිරීමට කටයුතු කර තිබිණි. අප වටහා ගතයුත්තේ තොරතුරු දැනගැනීමේ අයිතිය යනු හුදෙක් තොරතුරු ලබාගැනීමට පමණක් ඇති මෙවලමක් නොවන බවත් ඒ හරහා ක්‍රියාත්මක වී තම පුද්ගලික ගැටලු මෙන්ම පොදු ගැටලු ද විසඳා ගතහැකි අවියක් ලෙසද භාවිතා කළ හැකි බවයි.

පරිසරය සුරැකීම අප කාගේත් වගකීමක් වන අතර ඊට අදාල බලධාරී ආයතන ද ඔවුන්ගෙන් ඉටුවන වගකීම හරිහැටි ක්‍රියාත්මක කිරීමට නිසි වැඩපිළිවෙලක් සහ යාන්ත්‍රණයක් බලාත්මක කළ යුතුයි. වගකීම් පැහැර හැරි අවස්ථාවකදී එය අදාල ආයතනයෙන් ප්‍රශ්න කිරීමට අපට අයිතියක් ලැබෙන අතර එලෙස වගකීම් පැහැර හැරීමට සාධාරණ හේතුවක් තිබේදැයි යන්න විපරම් කළ යුතුයි. ඒ වගේම රාජ්‍ය ආයතනයක් තුළින් ඉටුවිය යුතු මූලික වගකීම් ඉටුනොවන විට ඒ සඳහා අපට ගත හැකි එක් පළමු පියවරක් වන්නේ තොරතුරු පනතින් ප්‍රශ්න කිරීමයි.

කෙසේ නමුත් අප තොරතුරු අයිතිය අපගේ ගැටලු වලට විසදුමක් ලබාදෙන මූලික පියවරක් ලෙස හඳුනා ගත යුතුයි. නින්තවූර් මුහුදු තිරය තොරතුරු අයදුම්පත්‍රයක් යොමු කිරීමෙන් පසුව පිරිසිදු වුනත් වෙන අවස්ථාවක අදාල ගැටලුව තොරතුරු අයදුම්පතක් දැමීමෙන් පමණක් නිරාකරණය නොවී තිබිය හැකියි. එසේනම් එවැනි අවස්ථාවක කල යුත්තේ අප ලබාගන්නා තොරතුරු තුලින් ප්‍රශ්න විසඳාගැනීමට අවශ්‍ය මූලික අඩිතාලම සකස් කරගැනීමයි. ඉන් පසුව අධිකරණ හෝ අධිකරණමය නොවන යාන්ත්‍රණයන් ඔස්සේ ගැටලුවට අවශ්‍ය විසදුම් සොයාගත හැකිවනු ඇත.